# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 175 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 30/01/2024 පැය 1130

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.01.30 වන අද දින දේශපාලන පක්ෂයකට සම්බන්ධ පිරිසක් මාලිගාවත්ත පොලිස් වසමේ මුස්ලිම් කනත්ත අසල සිට විරෝධතා පාගමනක් ආරම්භ කිරීමට නියමිත බවට මාලිගාවත්ත පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොළඹ ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව කොළඹ ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සඳහන් වග උත්තරකරුවන් වන

1. සමගි ජන බලවේග පක්ෂ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී සජිත් ප්‍රේමදාස මහතා.
2. සමගි ජන බලවේගයේ පක්ෂ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර මහතා
3. මැද කොළඹ සමගි ජන බලවේග ප්‍රධාන සංවිධායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා
4. මැද කොළඹ සමගි ජන බලවේග සංවිධායක අප්සරා අමරසිංහ මහත්මිය
5. සමගි ජන බලවේග ක්‍රියාකාරි සාමාජිකයින් සහ ක්‍රියාකාරි කාන්තා සංවිධාන

ඇතුළු සහභාගී වන සියළු සාමාජිකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින්ට මාලිගාවත්ත පොලිස් වසමේ මුස්ලිම් කනත්ත අසළ සිට ප්‍රදීපා මාවත, සද්ධර්ම මාවත, ජයන්ත වීරසේකර මාවත, මිල්ටන් පෙරේරා මාවත හා ජුම්මා හන්දිය හරහා සංඝරාජ වටරවුම ඔස්සේ සංඝරාජ මාවත මාර්ග භාවිතා කරන පුද්ගලයින්ට හා පදිකයින්ට අවහිර බාධා වන සේ කටයුතු කිරීම හා ප්‍රධාන මාර්ගය අවහිර වන සේ ගමනාගමනයට බාධා වන ආකාරයට කටයුතු කිරීම තහනම් කරමින් ආඥාවක් නිකුත් කර ඇත.